# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒආර්අයි/ඩී /එස්එල්සීසී/එෆ් /2023/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ඔක්තෝම්බර් 11 දින

ශ්‍රී ලංකා කජු සංස්ථාව
සභාපති කාර්යාලය
15 OCT 2024
1334, පරණ කෝට්ටේ පාර,
රාජගිරිය

සභාපති

ශ්‍රී ලංකා කජු සංස්ථාව

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව කජු මද විකුණුම් වටිනාකම රු.167,815,472 ක් ලෙස සහ විගණනයට ඉදිරිපත් කල වාර්තා අනුව එම වටිනාකම රු.160,485,428 ක් වූයෙන් රු.7,330,044 ක වෙනසක් විය.

(ආ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල කජු මද කි.ග්‍රෑම 1 ක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී යොදාගතයුතු සංරචකවලට අමතරව වර්ෂයේ ආරම්භක තොගයේ වටිනාකම යොදාගැනීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය අධිගණනය වී 2023 වර්ෂයේ අවසන් තොගයේ වටිනාකම රු. 6,985,467 කින් අධිතක්සේරු වී තිබුණි.

(ඇ) දේපල පිරියත භාවිතයට ගැනීමට අපේක්ෂිත තත්වයට ගෙන එන තෙක් දරන වියදම, එකවර ප්‍රාග්ධනිත නොකර භාවිතය ගැනීමට අපේක්ෂිත තත්වයට පත්වන තෙක් කෙරීගෙන යන වැඩ යටතේ වර්ගීකරණ කල යුතු වුවද සංස්ථාව විසින් කොන්ඩච්චි වතුයායේ විදුලි වැට ඉදිකිරීමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවීමට සම්බන්ධ පුවත්පත් දැන්වීම් පල කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය වූ රු.513,912 ක්, 2023 වර්ෂයේදී ඉඩම් ගිණුමට හර කර තිබුණි.

(ඈ) සංස්ථාවේ ණය අයකරගැනීමේ කාලසීමාව දින 60 ක් වුවද දින 90 ඉක්මවූ වෙළඳ ණයගැති ශේෂය රු.4,982,960 ක් වූ අතර එම ශේෂය තුළ වසර දෙකක් ඉක්මවූ එක් පෞද්ගලික ආයතනයකින් පමණක් අයවිය යුතු රු.1,474,410 ක ණය ශේෂය අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා වෙන් කිරීමක් ද කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට මීට වසර 10කට පෙර රු.9,466,200 ක කජු පැළ ලබා දී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් වෙනත් ණයගැති ශේෂය තුළ ඇති එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිවුවද ඒ සඳහා ගිණුම් මඟින් ගැලපීමට කටයුතු කර නොතිබුණි .

(ඊ) වර්ෂ 01 කට වඩා වැඩි වෙනත් ණයගැති වටිනාකම වූ රු.17,447,496 ක් සඳහා වෙන් කරන ලද හානිකරණ අලාභය රු.2,106,184 කි. 2018 වර්ෂයේ සිට හානිකරණ අලාභ ලෙස සෑම වර්ෂයකම එකම අගයක් පවත්වා ඇතත් එම අගය වාර්ෂිකව යාවත්කාලීන කර අවශ්‍ය ගැලපීම් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(උ) සංස්ථාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම වතුයායේ 2000 වර්ෂයේදී වගා කරන ලද තේක්ක පැල 2023 වර්ෂය වන විට දැව ලබා ගැනීමේ තත්ත්වය දක්වා වර්ධනය වී ඇති අතර එහි ඇති ගස් ප්‍රමාණය 4,253 ක් පමණ වේ. එම ගස්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (සේවක ප්‍රතිලාභ) හි 139 ඡේදය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ රු.40,514,827 ක ශේෂයට අනුරූපීව කිසිදු ආයෝජනයක් සිදු කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 (සේවක ප්‍රතිලාභ) හි 135 (ආ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම (Defined benefit plans) සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරීමක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම එහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලී ආදායම හෝ වියදම, සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කරන ලද ගෙවීම් සහ ආයුගණන ලාභය/අලාභය යනාදී අයිතමයන් වෙන් වශයෙන් දැක්විය යුතු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාල සටහනෙහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලී වියදම, ආයුගණන අලාභය යන සංරචකවල එකතුව වන රු.8,517,181 ක වටිනාකම, වර්ෂය සඳහා වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන 19 හි පෙන්වා තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ වල දල ධාරණ අගය (Gross Carrying Value amount) මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කල යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 136,155,472 ක් වූ දැනට භාවිතා කරමින් පවතින දේපල, පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 73 වගන්තිය අනුව දේපල පිරියත උපකරණ යටතට ගෙනෙන පිලිවෙලින් පිරිවැය රු.129,319,656 හා රු. 6,623,082 වූ පරිනත කප්‍රු වගාවේ හා පොල් වගාවේ වර්ෂයේ ආරම්භක ශේෂය, වර්ෂය තුල එකතුවීම්, වර්ෂය තුල ඉවත් කිරීම් හා වර්ෂය අවසානයේ ශේෂය දැක්වෙන සැසඳුමක් මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(ඕ) 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සංස්ථාව දිගින් දිගටම අලාභ ලබමින් තිබුණු අතර ආසන්නතම වර්ෂ 05 තුළ එනම් 2019 සිට 2023 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ද්‍රෂ්‍ය අලාභය රු. මිලියන 148 සිට මිලියන 102 දක්වා පරාසයක් වී තිබුණි. මේ අනුව අඛණ්ඩව අලාභ ලැබීම , කාර්යමණ්ඩල පුරප්පාඩු හා පවත්නා කප්‍රු වතු උපරිම ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම වැනි හේතු මත සංස්ථාවේ පැවැත්ම අභියෝගාත්මක වන අතර රජයේ ප්‍රධාන නොලැබුණහොත් අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වන බව නිරීක්ෂණය විය.

ංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති ත් වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම ැසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්,නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ,2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ),(ඉ),(ඊ), (උ),(ඌ),(එ) (ඒ) හා (ඔ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | සංස්ථාව විසින් 2011 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන වල එම කාලපරිච්ඡේදවලට අදාළව රු.779,483 ක රඳවාගත් බදු (WHT) ලැබිය යුතු ශේෂයක් පෙන්නුම් කර තිබුණි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය | ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් 2024 ජූනි 11 දිනට නිරවුල් නොකල විගණන ගාස්තුව රු.1,934,310 ක් විය. |
| (ඇ) | 2012 ජූලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ | සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ලබා දී ඇති කප්පු වගා කරන ඉඩම් අක්කර 11,513 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු 2023 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි. |

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කජු වගා කර තිබෙන බිම් ප්‍රමාණය දළ වශයෙන් අක්කර 3,449 ක් වූ අතර ඵල දරන කජු ගස් සංඛ්‍යාව 51,685 ක් විය . එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු.78,708,150 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද එම කජු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ ලේඛනයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි.

(ආ) ආයතනයේ වෙබ් අඩවිය හරහා අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයට කජුමද විකිණීම ආරම්භ කර තිබුණද එම වෙබ් අඩවිය අකර්මන්‍ය වීම හේතුවෙන් 2023 වර්ෂයේ කජුමද මාර්ගගත විකුණුම් රු. 32,230ක් වැනි අවම මට්ටමක පැවතුනි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීමේ බැංකු ගිණුමේ පැවති රු.141,831,715 ක ශේෂය උපරිම ඵලදායිව ආයෝජනය කර නොතිබුණි.

(ඈ) එවකට පැවති සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ලෙලි කජු මිලදී ගැනීම සඳහා 2005 වර්ෂයේදී ආපසු ගෙවීමේ පදනම මත වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් රු.3,500,000 ක් හා ඊට අදාළ පොලිය වන රු. 927,500 ක මුදල සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාව පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අංක 60/07 හා 1973 මැයි 25 දිනැති ගැසට් නිවේදනයේ පලමු උපලේඛනයේ (අ), (ඇ), (ඈ) (ඊ) සහ (ඌ) වගන්තිවල සඳහන් කරුණු ඉටුකර ගැනීම කෙරෙහි 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ඉතා අඩු අවධානයක් යොමුවී තිබූ අතර එනම් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම, අලෙවිය හා අපනයනය දියුණු කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් සමඟ එක්ව කටයුතු කිරීම සහ විමර්ශන හා පර්යේෂණ කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාව සතුව භාරයේ පවතින වතු 13 ක ඉඩම් වල ප්‍රමාණය අක්කර 11,363 කින් අක්කර 3,449 ක් පමණක් කජු වගා කර ඇතත් වගා නොකල ඉඩම් ප්‍රතිශතය සියයට 70 ක් විය. එසේම ඵලදා වාර්තා අනුව 2019 වර්ෂයේ සිට 2023 දක්වා කාලය තුළ මෙ.ටොන් 157.81 සිට 60.40 දක්වා කජු ඵලදාව අඩු වී සාමාන්‍ය කජු නිෂ්පාදනය මෙ.ටොන් 107.54 ක අගයක් ගෙන තිබුණි. බද්ධ කජු ගස් අක්කරයකට ගස් 70 ක් හා බීජ කජු ගස් අක්කරයකට ගස් 40 බැගින් වගා කල ඵල දරන කජු ගස් ප්‍රමාණය 51,685 ක් ලෙස දක්වා තිබුණි. 2022 වර්ෂයේදී කජු ඵලදාව මෙ.ටොන් 60.40 ක් වූ අතර අක්කරයක අස්වැන්න කජු කි.ග්‍රෑම් 17.64 ක අඩු අගයක් ගෙන තිබුණි. ඒ අනුව එක් කජු ගසක සාමාන්‍ය අස්වැන්න

කිලෝග්‍රෑම් 1.17 ක් වැනි දුර්වල තත්ත්වයක පැවතියද නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සාර්ථක පියවර ගෙන නොතිබුණි.

(ට) පුත්තලම, කමන්දෙවව හා අම්පාර හාඩි වතුවල පිහිටි පොල්ගස් සංඛ්‍යාව 4,184 ක් වූ අතර, නොමේරූ ගස් 1,147 , ඵලදා ලබන ගස් 2,391 ක් හා කපාවූ ගස් 646 කින් සමන්විත වී තිබුණි. 2023 වර්ෂයේ පොල් ඵලදාව ගෙඩි 57,425 ක් වී තිබුණු අතර එම ඵලදාවේ විකුණුම් වටිනාකම රු. 2,613,047 ක් විය. ඒ අනුව ඵලදාව ලබන ගසක වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි 24 ක් වී තිබුණු අතර විකුණුම් ආදායම රු.1,092 ක් වී තිබුණි. ඵලදාව වැඩිකර ගැනීමට පොල් ගස් නඩත්තු කිරීම හා පොහොර යෙදීම දුර්වල වීමත්,කපාවූ පොල්ගස් 491 ක් ඉවත් කිරීම හා ඒ වෙනුවෙන් නව පැළ සිටුවීමට කටයුතු කර නොතිබුණි.

(ඨ) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වාර්තා අංක SLCC/PLC/CI/22/2023 හි ශ්‍රී ලංකාවේ හෙක්ටයාර් 70,000 ක් පමණ කජු වගාවන් පවතින අතර වර්ෂයකට මෙ.ටොන් 100,000 ක් හා 120,000 ක අතර ප්‍රමාණයක් කජු පුහුලන් අපතයක් හා කජු නිෂ්පාදනයෙන් පසු සියයට 75 ක කජු ලෙලි අපතයක් ලෙස එනම් දළ වශයෙන් මෙ.ටොන් 59.415 ඉවත් වේ. සංස්ථාවේ මෙම අපතයන් ලෙස ඉවත් කරනු ලබන කජු පුහුලන් හා කජු ලෙලි වලින් අතුරු නිෂ්පාදනයක් කිරීමට හෝ පවතින නිෂ්පාදන සංවර්ධනය කිරීමට එම නිෂ්පාදන කර්මාන්තයේ කර්මාන්තකරුවන් සොයා එම කජු පුහුලන් අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින විදුලිජනක යන්ත්‍රය (Generator),බොයිලේරුව (Boiler),කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය හා පුත්තලම පිරිසැක්සුම් මධ්‍යස්ථානයේ පවතින බොයිලේරුව (Boiler) අක්‍රීය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඪ) නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු පිරිසැකසුම් බොයිලේරුව 2015 වසරේ සිට ක්‍රියාවිරහිත වී කජු තැම්බීමේ ක්‍රියාවලිය නතරවී තිබුණි. අබලන් වූ බොයිල්ලේරුව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ණ) නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ශ්‍රේණිගත කිරීම හා ඇසුරුම් කිරීමේ අංශයට 2021 වර්ෂයේ රු.8,100,000 ක් වැයකර විනාඩියකට පැකට් 60 ක් ඇසුරුම් කළ හැකි ස්වයංක්‍රීය ඇසුරුම් කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දින දක්වා එම ඇසුරුම් යන්ත්‍රය භාවිතා නොකර නිෂ්කාර්යව තිබුණි.

(ට) මන්නාරම දිස්ත්‍රික්කයේ කොන්ඩච්චි කජු වතු යායේ නැගෙනහිර මායිමේ කල්ලාරු ඔය පිහිටි ප්‍රදේශයේ අක්කර 02 ක භූමි කොටසක් ගිවිසුමකින් තොරව විදුලි බල මණ්ඩලයේ ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ලංකා විදුලි බල මණ්ඩලය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර කිසිදු බදු ආදායමක් හෝ කුලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය සඳහා 2021 වර්ෂයේදී සියයට 10 ක් වූ රඳවා ගැනීමේ තැන්පතු මුදල හැර රු. 7,092,000 ක් වැය කර මිලදී ගත් කජු පිරිසැකසුම් කිරීමේ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම හේතුවෙන්  කිසිදු ප්‍රයෝජනයක් නොගෙන 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව තිබුණි. සැපයුම්කරුට එරෙහිව නීති මාර්ගයෙන් කටයුතු කිරීමට අමාත්‍යාංශයේ නීති අංශයේ උපදෙස් මත ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දන්වා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රයේ සැපයුම්කරුට එරෙහිව නීති මඟින් කටයුතු කර නොතිබුණි.

(ත) පුත්තලම කමන්දලව කජු වතුයායේ බම්බිතුලම වැව ආශ්‍රිත ප්‍රදේශයේ අනවසර වැලි කැනීම පිළිබඳව රත්නායකපුර පොලිසියට හා පොලිස්පති වෙත 2021 වර්ෂයේදී සංස්ථාවේ සභාපති දැනුම් දී තිබු නමුත් එම අනවසර වැලි කැණීම නැවැත්වීමට අපොහොසත් වී තිබුණි. ඒ හේතුවෙන් වතුයායේ ආරක්ෂාවට හා පරිසරයට අහිතකර ලෙස බලපා තිබුණි.

(ද) සංස්ථාවේ  කජු වතුයායවල 2023 වර්ෂයේ ඉලක්කගත අස්වැන්න හා එම වර්ෂයේදී ලැබු ලෙලි කජු අස්වැන්න සැසඳීමේදී වතුයාය 13 න් කොන්ඩච්චි වත්තෙහි හැර කජු වතුයායන් 12 ක ඉලක්ක ලඟා කරගෙන නොතිබුණි. එම ඉලක්ක ලගා කර නොගැනීමේ ප්‍රතිශතය සියයට 49 ක් වී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී කජු වතුයායන් 2 ක හැර කජු වතුයායන් 11 ක ලෙලි කජු එලදාව කි.ග්‍රෑම් 15,148 කින් අඩු වී තිබුණි.

(න) අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර කළමනාකරු ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2010  සිට 2022 වර්ෂයේ අවසානය දක්වා කජු වගාකල යුතු ඉලක්ක ඉඩම් අක්කර ප්‍රමාණය 5085 ක් වී තිබුණු අතර කජු  වගා කරන ලද අක්කර ප්‍රමාණය  4929 ක් වී තිබුණි. 2020 සිට 2022 වර්ෂය දක්වා සහනාධාර කජු වගා වැඩසටහන් යටතේ අක්කර 569 ක් සඳහා ගොවීන් 467 දෙනෙකු වෙත කජු පැළ 39,865ක් බෙදා හැර තිබු නමුත් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ කජු නිෂ්පාදන හා පිරිසැකසුම් කර්මාන්තයේ යෙදෙන පුද්ගලයින් සංඛ්‍යාව එකක් බව දක්වා තිබුණි. මේ අනුව සංස්ථාව විසින් එම දිස්ත්‍රික්කයේ කජු නිෂ්පාදන හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ට) මිහින්තලේ කජු පැළ තවානේ භාවිතය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට (අනුරාධපුර භූ ගත ජල අංශය) රු.688,390 ක් ගෙවා 2022 වර්ෂයේදී නළ ළිදක් ඉදි කර ඇතත් 2023 දෙසැම්බර් 31 දින දක්වා එය භාවිතයට ගෙන නොතිබුණි.

(ඩ) අනුරාධපුර දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාලය අනුරාධපුර නගරයේ පිහිටා තිබුණු අතර කජු පැළ තවාන මිහින්තලය ප්‍රදේශයේ පිහිටා තිබුණි.ඒ ස්ථාන දෙක අතර දුර කිලෝ මීටර 14 ක් විය.ඒ හේතුවෙන් කජු පැළ ලබා ගත යුතු පාරිභෝගිකයින් අනුරාධපුර ව්‍යාපෘති කාර්යාලයට මුදල් ගෙවා කජු පැළ තවානට ගොස් කජු පැළ මිලදී ගැනීමට අතිරේක ක්‍රියාමාර්ගයක් සහ වියදමක් දැරිය යුතු බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**Sri Lanka Cashew Corporation**

# STATEMENT OF PROFIT OR LOSS AND OTHER COMPREHENSIVE INCOME

**for the year ended 31st December 2023**

**(All amounts in Sri Lankan Rupees)**

| | Note | For the year 2023 | For the year 2022 |
|---|---|---|---|
| Revenue | 01 | 176,317,074.88 | 134,849,168.44 |
| Cost of Sales | 02 | 135,914,991.25 | 83,472,666.14 |
| Gross Profit/ ( Loss ) | | 40,402,083.63 | 51,376,502.30 |
| Govt. Grant(Recurrent) | | 80,400,000.00 | 77,500,000.00 |
| Other Income | 03 | 76,599,384.80 | 69,390,183.13 |
| | | 197,401,468.43 | 198,266,685.43 |
| Selling & Distribution Expenses | 04 | 18,339,750.18 | 15,029,109.31 |
| Administration Expenses | 05 | 144,792,740.06 | 145,510,078.61 |
| Other Expenses | 06 | 39,094,227.07 | 23,101,087.38 |
| Finance Expenses | | 195,331.17 | 154,999.16 |
| | | 202,422,048.48 | 183,795,274.46 |
| Profit / (Loss) for the Year | | (5,020,580.05) | 14,471,410.97 |

**Other Comprehensive Income**

| | For the year 2023 | For the year 2022 |
|---|---|---|
| Profit / (Loss) for the Year | (5,020,580.05) | 14,471,410.97 |
| (-) Acturial (Gain) / Loss | 153,725.00 | (2,232,295.00) |
| Income Tax on Othe Comprehensive Income | - | - |
| **Other Comprehensive Income for the Year, Net of tax** | 153,725.00 | (2,232,295.00) |
| **Total Comprehensive Income for the Year, Net of Tax** | (5,174,305.05) | 16,703,705.97 |

Sri Lanka Cashew Corporation

# STATEMENT OF FINANCIAL POSITION

**for the year ended 31st December 2023**
**(All amounts in Sri Lankan Rupees)**

| | Note | As At 31.12.2023 | As At 31.12.2022 |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Non Current Assets** | | | |
| Property Plant & Equipment | 07 | 113,259,962.51 | 116,124,752.11 |
| Mature Area Expenditure | 08 | 81,699,082.73 | 25,316,396.38 |
| Immature Area Expenditure | 09 | 46,008,475.80 | 98,080,023.96 |
| Other Small Projects | 10 | 840,654.67 | 588,524.09 |
| Capital Work in Progress | | 22,134,175.60 | 6,542,597.00 |
| **Total Non Current Assets** | | 263,942,351.31 | 246,652,293.54 |
| **Current Assets** | | | |
| Stocks | 11 | 105,483,926.55 | 76,769,613.94 |
| Trade Debtors & Other Receivables | 12 | 28,640,033.48 | 31,800,793.00 |
| Deposits, Advances & Prepayments | 13 | 9,751,226.20 | 50,638,657.60 |
| Cash & Cash Equivalents | 14 | 156,598,891.68 | 143,842,699.56 |
| **Total Current Assets** | | 300,474,077.91 | 303,051,764.10 |
| **Total Assets** | | **564,416,429.22** | **549,704,057.64** |
| **EQUITY & LIABILITIES** | | | |
| **Equity** | | | |
| Initial Capital | | 40,000,000.00 | 40,000,000.00 |
| Government Grant | | 300,697,860.49 | 281,565,222.86 |
| Grant from Other Parties | 15 | 246,157,218.48 | 280,919,046.17 |
| Capital Reserves | 16 | 17,441,846.85 | 17,441,846.85 |
| Profit & Loss Account | | (156,859,994.82) | (152,058,776.37) |
| **Total Equity** | | 447,436,931.00 | 467,867,339.51 |
| **Non Current Liabilities** | | | |
| Provision for Gratuity | | 40,514,827.00 | 35,789,916.00 |
| Long Term Loan | 17 | 3,500,000.00 | 3,500,000.00 |
| **Total Non Current Liabilities** | | 44,014,827.00 | 39,289,916.00 |
| **Current Liabilities** | | | |
| Trade Creditors & Other Payables | 18 | 72,964,671.22 | 42,546,802.13 |
| **Total Current Liabilities** | | 72,964,671.22 | 42,546,802.13 |
| **Total Equity & Liabilities** | | **564,416,429.22** | **549,704,057.64** |

-

**The Accounting Policies and Notes on pages 05 to 19 form an integral part of these Financial Statements.**
**The Financial Statements have been prepared and presented in compliance with Sri Lanka Accounting Standards issued by the institute of Chartered Accountants of Sri Lanka.**

**M.T.S.K.Peiris**
**Assistant General Manager Finance**

**K.G.P.P. Abesirigunawardana**
**General Manager**

**The Board of Directors is responsible for preparation and presentation of these Financial Statements. Signed for and on behalf of the Board by:**

**K.G. Abayagunawardana**
**Chairman**

**P.G. Kusum**
**Deputy Chairperson**

**A.P.P.D. Chandurangi**
**Director**

**R.A.R.S. Mayadunna**
**Director**

Sri Lanka Cashew Corporation

## STATEMENT OF CHANGES IN EQUITY

**for the year ended 31st December 2023**
**(All amounts in Sri Lankan Rupees)**

| | Initial Capital | Government Grant | Grant from Ministries | Capital Reserve | Profit & Loss | Total |
|---|---|---|---|---|---|---|
| Balance as at 01.01.2022 | 40,000,000.00 | 289,534,925.21 | 286,736,184.04 | 17,441,846.85 | (167,065,129.24) | 466,647,826.86 |
| Prior Year Adjustment | - | - | - | - | (1,697,353.10) | (1,697,353.10) |
| Grant Received during the year | - | 29,000,000.00 | - | - | - | 29,000,000.00 |
| Transfers to Profit & Loss Account | - | (36,969,702.35) | (5,817,137.87) | - | - | (42,786,840.22) |
| Profit/(Loss) for the Year | - | - | - | - | 14,471,410.97 | 14,471,410.97 |
| Net Acturial Gain/(Loss) | - | - | - | - | 2,232,295.00 | 2,232,295.00 |
| Balance as at 31.12.2022 | 40,000,000.00 | 281,565,222.86 | 280,919,046.17 | 17,441,846.85 | (152,058,776.37) | 467,867,339.51 |
| | | | | | | |
| Balance as at 01.01.2023 | 40,000,000.00 | 281,565,222.86 | 280,919,046.17 | 17,441,846.85 | (152,058,776.37) | 467,867,339.51 |
| Prior Year Adjustment | - | - | - | - | 373,086.60 | 373,086.60 |
| Grant Received during the year | - | 47,000,000.00 | - | - | - | 47,000,000.00 |
| Transfers to Profit & Loss Account | - | (27,867,362.37) | (34,761,827.69) | - | - | (62,629,190.06) |
| Profit/(Loss) for the Year | - | . | - | - | (5,020,580.05) | (5,020,580.05) |
| Net Acturial Gain/(Loss) | - | - | - | - | (153,725.00) | (153,725.00) |
| **Balance as at 31.12.2023** | **40,000,000.00** | **300,697,860.49** | **246,157,218.48** | **17,441,846.85** | **(156,859,994.82)** | **447,436,931.00** |

**Sri Lanka Cashew Corporation**

## STATEMENT OF CASH FLOW

**for the year ended 31st December 2023**
**(All amounts in Sri Lankan Rupees)**

| | For the year 2023 | For the year 2022 |
|---|---|---|
| **Cash Flows from Operating Activities** | | |
| Profit for the year | (5,174,305.05) | 16,703,705.97 |
| Prior Year Adjustment | 373,086.60 | (1,697,353.10) |
| **Adjustments for items not involving movement of cash** | | |
| Depreciation | 11,992,822.60 | 11,416,492.60 |
| Amortization | 5,848,541.53 | 2,736,980.19 |
| Provision for Gratuity | 9,194,381.00 | 4,656,008.00 |
| Bad debtors written off & Pro. for Impairment Loss | 106,948.00 | 64,252.00 |
| Over Provision of Gratuity | - | (6,837,703.50) |
| Writen off cost of Motor Vehicles | - | 1,716,845.00 |
| Write off accumulated depreciation on Motor Vehicles | - | (646,578.84) |
| Written off Grant From Other Parties | (369,786.87) | (369,786.87) |
| Written off other Small Projects | - | 39,243.95 |
| Interest Income Received | (3,680,856.44) | (4,888,275.31) |
| Government Grant Amortization | (27,867,362.37) | (36,969,702.35) |
| Operating Profit/(loss) before changes in items of working capital | (9,576,531.00) | (14,075,872.26) |
| **Changes in items of Working capital** | | |
| Stocks - (Increase)/Decrease | (28,714,312.58) | 14,182,543.37 |
| Debtors - (Increase)/Decrease | 3,053,811.52 | 15,525,174.63 |
| Advances and Prepayments - (Increase)/Decrease | 40,887,431.40 | (6,825,739.75) |
| Creditors - Increase/(Decrease) | 29,491,119.01 | (8,405,120.92) |
| Accrued Expenses - Increase/(Decrease) | 926,750.08 | (2,172,327.32) |
| | **45,644,799.43** | **12,304,530.01** |
| | 36,068,268.43 | (1,771,342.25) |
| Payment of Gratuity | (4,469,470.00) | (4,976,432.50) |
| Cash used in/generated from operating activities | **31,598,798.43** | **(6,747,774.75)** |
| **Cash flows from Investing Activities** | | |
| Purchase of fixed assets | (9,128,033.00) | (11,058,103.55) |
| Capital Work in Progress | (15,591,578.60) | (179,613.90) |
| Investment on New Planting | (10,159,679.75) | (26,488,469.85) |
| Interest Income Received | 3,680,856.44 | 4,888,275.31 |
| Investments on Other Small Projects | (252,130.58) | - |
| | **(31,450,565.49)** | **(32,837,911.99)** |
| **Cash Flows from Financial Activities** | | |
| Government Grant | 47,000,000.00 | 29,000,000.00 |
| Grant From Ministries | (34,392,040.82) | (5,447,351.00) |
| Increase in cash & cash equivalents | 12,756,192.12 | (16,033,037.74) |
| Cash & cash equivalents at the beginning of the year | 143,842,699.56 | 159,875,737.30 |
| Cash & cash equivalents at the end of the year | **156,598,891.68** | **143,842,699.56** |

| | As at 31.12.2023 | As at 31.12.2022 |
|---|---|---|
| Cash in hand | 3,308,168.92 | 1,943,877.88 |
| Cash at Bank | 11,427,452.83 | 10,289,586.02 |
| Savings | 141,863,269.93 | 131,609,235.66 |
| | **156,598,891.68** | **143,842,699.56** |

## Notes to the Financial Statement for the Year Ended 31.12.2023

**(All amounts in Sri Lankan Rupees)**

**Note - 01**

| Revenue | for the year 2023 | for the year 2022 |
|---|---|---|
| Kernels | 167,922,980.38 | 113,791,178.44 |
| **Less:** Return Inwards | (107,508.00) | - |
| | 167,815,472.38 | 113,791,178.44 |
| Plants | 8,501,602.50 | 21,057,990.00 |
| Raw Cashew | - | - |
| | **176,317,074.88** | **134,849,168.44** |

**Note - 02**

**Trading Account for the year 31.12.2022**

| Cost of Sales | for the year 2023 | for the year 2022 |
|---|---|---|
| **Opening Stock** | **27,028,311.72** | **24,425,421.36** |
| Kernels | 10,685,093.21 | 3,894,533.06 |
| Plants | 16,343,218.51 | 20,530,888.30 |
| **Add: Purchases** | | |
| Purchases | - | - |
| Production Expenses Kernels **- Note 2.1** | 126,725,390.69 | 98,903,031.69 |
| Production Expenses Plants **- Note 2.2** | 20,876,162.21 | 13,985,793.66 |
| | 147,601,552.90 | 112,888,825.35 |
| | 174,629,864.62 | 137,314,246.71 |
| **Less: Closing Stock** | | |
| Kernels | 8,611,790.71 | 10,685,093.21 |
| Plants | 20,060,120.78 | 16,343,218.51 |
| **Less:** | | |
| Internal Transfers (Plants) | 6,780,440.16 | 21,303,755.70 |
| Free Issues | 984,217.21 | 936,400.21 |
| Dead Plants | 2,216,262.72 | 3,615,782.19 |
| Sample & Compliments | 62,041.79 | 957,330.75 |
| | 38,714,873.37 | 53,841,580.57 |
| | **135,914,991.25** | **83,472,666.14** |

**Note - 03**

| Other Income | for the year 2023 | for the year 2022 |
|---|---|---|
